කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2012

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

திறைசேரி செயற்பாடுகள் திணைக்களம்

Department of Treasury Operations

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
කොළඹ 01

நிதி திட்டமிடல் அமைச்சு
கொழும்பு 01

Ministry of Finance & Planning
Colombo 01.

පටුන

		පිටු අංකය
1.	දැක්ම	02
2.	මෙහෙවර	02
3.	හැඳින්වීම	02
4.	ප්‍රධාන කාර්යයන්	02
5.	සංවිධාන ව්‍යුහය හා සේවක සංඛ්‍යා තොරතුරු	03
6.	මානව සම්පත් සංවර්ධනය	05
7.	මූල්‍ය කාර්ය සාධනය	06
8.	භෞතික කාර්ය සාධනය	08
8.1	මුදල් කළමනාකරණය	08
8.2	රාජ්‍ය ණය කළමනාකරණය	18
8.3	විදේශාධාර කළමනාකරණය	23
8.4	රාජ්‍ය ආදායම්	24
8.5	කේවල ගිණුම් ක්‍රමයේ සහ විද්‍යුත් ගෙවීම් ක්‍රමයේ ප්‍රගතිය	31

1. දැක්ම

රාජ්‍ය අරමුදල් කළමනාකරණයේ දකුණු ආසියානු කලාපයේ විශිෂ්ඨතමයා බවට පත්වීම.

2.මෙහෙවර

අරමුදල් ගිණුම්කරණය හා රාජ්‍ය ණය ගිණුම්කරණය පිළිබඳ භාරකාරත්වය දරමින්, රාජ්‍ය වැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ අරමුදල හා වෙනත් භාණ්ඩාගාර අරමුදල් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් උපයෝගී කර ගැනීමද, ආදායම් එකතු කිරීම් හා රාජ්‍ය ණය ගැනීම් සම්බන්ධව සම්බන්ධීකාරකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා කැපවීම.

3. හැඳින්වීම

භාණ්ඩාගාරය තුළ ඒකාබද්ධ අරමුදල යටතේ ක්‍රියාත්මක රාජ්‍ය මුදල් ප්‍රවාහය හා රාජ්‍ය ණය සම්බන්ධයෙන් අදාල කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ අභිලාෂයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2004 ජුලි 28 දින ආරම්භ කරන ලදි. මෙම අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික අයවැය ලේඛණයේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්,තත්‍ය මුදල් ගලා ඒම් හා මුදල් ගලායාම් බවට පරිවර්තනය කරගෙන ඒවා කාර්යක්ෂමව හා ඵළදායිව කළමනාකරණය කිරීමට අවශ්‍ය සැලසුම් වාර්ෂිකව, මාසිකව හා දෛනික පදනමින් සකස් කර, ජාතික අයවැය ලේඛණය මගින් පරිකල්පිත රජයේ ප්‍රතිපත්ති සාධනය කර ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරමින් පවති.

4. ප්‍රධාන කාර්යයන්:

- රාජ්‍ය මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම.
- දේශීය හා විදේශීය වාණිජ ණය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම.
- ගෙවීම් පද්ධතිය හරහා භාණ්ඩාගාරයේ අරමුදල් මුදා හැරීම.
- වියදම් ආයතනවල අරමුදල් අවශ්‍යතා තක්සේරු කර ප්‍රමුඛතා මත අරමුදල් නිදහස් කිරීම.
- භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම.
- රජයේ ණය දීම මඟින් ක්‍රියාත්මක වැඩසටහන්වලට අදාලව මූල්‍ය ප්‍රවාහ මෙහෙයවීම.
- බදු ආදායම් ශීර්ෂ 1 ක් හා බදු නොවන ආදායම් ශීර්ෂ 11 ක් යටතේ ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම හා ගිණුම්ගත කිරීම.
- විදේශාධාර ණය හා ප්‍රදාන යටතේ ලැබෙන මුදල් වැය යෝජනා සඳහා පහසුකම් සැලසීම.
- රජයේ ණය ගැනීම් හා ආපසු ගෙවීම් ගිණුම්ගත කිරීම.
- රජයේ බැංකු ගිණුම් හා අග්‍රිම ගිණුම් ආරම්භ කිරීම සඳහා බලය දීම හා අධීක්ෂණය.
- විදේශ මූල්‍ය ව්‍යාපෘති පිළිබඳව උපදෙස් ලබා දීම, අධීක්ෂණය, ගිණුම් තැබීම හා පහසුකම් සැපයීම.

5. සංවිධාන ව්‍යුහය හා සේවක සංඛ්‍යා තොරතුරු

5.1 සංවිධාන ව්‍යුහය



5.2 සේවක සංඛ්‍යා තොරතුරු

2012.12.31 දිනට

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින කාර්ය මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්	01	01
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	02	01
ශ්‍රී.ලං.ප.සේ. III	01	01
ශ්‍රී.ලං.ග.සේ. I පන්තිය	05	04
ශ්‍රී.ලං.ග.සේ. II / III පන්තිය	11	09
පරිපාලන නිලධාරී	01	01
ගිණුම් විශ්ලේෂක	14	02
සංවර්ධන සහකාර	1	0
වැඩ සටහන් සහකාර	1	0
ගිණුම් සහකාර	2	0
රා.ක.ස. I පන්තිය	5	6
රා.ක.ස.II/III පන්තිය	54	47
තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සහකාර	7	5
රියදුරු	6	6
කා.සේ.සේ.1	1	3
කා.සේ.සේ.II /III	11	9
එකතුව	**123**	**95**

6. මානව සම්පත් සංවර්ධනය

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර සිටින නිලධාරින්ගේ කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ ත්‍රෛභාෂා පිළිබද දැනුම වැඩිකිරිමට හා හැකියාවන් වර්ධනය කිරිම පිණිස මිලෝදා ආයතනය, ශ්‍රී ලංකා පදනම් ආයතනය සහ මෙම දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල පැවැත්වූ පහත සඳහන් පුහුණු පාඨමාලාවන් සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සහ තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරින් 18 දෙනෙකු 2012 වර්ෂය තුළදි සහභාගි කරන ලදි.

1. කාර්යාල කළමනාකරණය
2. ඉංග්‍රිසි භාෂා සන්නිවේදන කුසලතාවය පිළිබඳ ඩිප්ලෝමාව
3. දෙමළ භාෂාව
4. MS Excel භාවිතයෙන් පැතුරුම්පත මෙහෙයවීම පිළබඳ පාඨමාලාව

ඉහත පාඨමාලාවන්ට අමතරව ධාරිතා සහ ස්වයං සංවර්ධනය පිළබඳව 2012 සැප්තැම්බර් 06 හා 07 දෙදින තුළ ගන්නෝරුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි පුහුණු මධ්‍යස්ථානය තුළ දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරින් උදෙසා නේවාසික පුහුණු පාඨමාලාවක් පවත්වන ලදි. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරින් 44 ක් පමණ සහභාගි විය.

තවද විධායක මට්ටමේ නිලධාරින් 06 දෙනෙකුට විදේශ පුහුණු පාඨමාලාවන්ට සහභාගි වීමට එම වර්ෂය තුලදි අවස්ථාව ලැබී ඇත.

7. මූල්‍ය කාර්ය සාධනය

වගුව 7 (අ) පුනරාවර්තන වියදම් කාර්ය සාධනය -2012

රු '000

වැය විෂය	කාණ්ඩය/වැය විෂය/අයිතමය/ විස්තරය	2011		2012		වැඩි වීම/ අඩුවීම 2011 වියදමට සාපේක්ෂව	වැඩි වීම/ අඩුවීම % 2011 තත්‍ය වියදම මත පදනම්ව
		ඇස්තමේන්තුව	තත්‍ය	ඇස්තමේන්තුව	තත්‍ය		
පුනරාවර්තන වියදම		**845,833**	**845,556**	**998,010**	**725,380**	**-120,176**	**(14.21)**
	පුද්ගල පඩිනඩි	**37,050**	**36,791**	**37,639**	**37,583**	**792**	**2.15**
1001	වැටුප් හා වේතන	29,200	28,982	29,400	29,365	**383**	**1.32**
1002	අතිකාල සහ නිවාඩු දින වැටුප්	500	500	600	597	**97**	**19.40**
1003	වෙනත් දීමනා	7,350	7,309	7,639	7,621	**312**	**4.27**
	ගමන් වියදම්	**1,439**	**1,434**	**2,013**	**2,012**	**578**	**40.31**
1101	දේශීය	29	28	67	66	**38**	**135.71**
1102	විදේශීය	1,410	1,406	1,946	1,946	**540**	**38.41**
	සැපයීම්	**3,130**	**3,128**	**3,720**	**3,679**	**551**	**17.62**
1201	ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	1,440	1,439	1,860	1,852	413	**28.70**
1202	ඉන්ධන	1,645	1,644	1,800	1,767	**123**	**7.48**
1203	ආහාරපාන හා නිල ඇඳුම්	45	45	60	60	**15**	**33.33**
	නඩත්තු වියදම්	**952**	**944**	**1368**	**1363**	**419**	**44.39**
1301	වාහන	630	625	725	722	**97**	**15.52**
1302	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	300	297	593	593	**296**	**99.66**
1303	ගොඩනැගිලි හා ඉදිකිරීම්	22	22	50	48	**26**	**118.18**
	සේවා	**2,225**	**2,222**	**2,421**	**2,328**	**106**	**4.77**
1401	ප්‍රවාහන	769	768	860	860	**92**	**11.98**
1402	තැපැල් සහ සන්නිවේදන	1,435	1433	1501	1408	**-25**	**(1.74)**
1405	වෙනත්	21	21	60	60	**39**	**185.71**
	මාරු කිරීම්	**801,037**	**801,037**	**950,849**	**678,415**	**-122,622**	**(15.31)**
1503-01	ලොතරැයි ආදායම් ආපසු ගෙවීම	306,145	306,145	450,000	402,567	**96,422**	**31.50**
1505-01	රාජ්‍ය සේවක රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රජයේ දායකත්වය	494,229	494,229	500,000	275,000	**-219,229**	**(44.36)**
1506	රජයේ සේවකයින් සඳහා දේපල ණය	663	663	849	848	**185**	**27.90**

වගුව 7 (ආ) මූලධන වියදම් මූල්‍ය කාර්ය සාධනය –2012

රු '000

වැය විෂය	කාණ්ඩය/වැය විෂය/අයිතමය/ විස්තරය	2011		2012		වැඩි වීම/ අඩුවීම 2011 වියදමට සාපේක්ෂව	වැඩි වීම/ අඩුවීම % 2011 තත්‍ය වියදම මත පදනම්ව
		ඇස්තමේන්තුව	තත්‍ය	ඇස්තමේන්තුව	තත්‍ය		
මූලධන වියදම්		**1,004,950**	**1,004,400**	**755,300**	**754,032**	**-250,368**	**-24.93**
	මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**3,800**	**3,284**	**3,700**	**3,198**	**-86**	**-2.62**
2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	100	64	100	100	36	**56.25**
2002 -1	භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම	3,300	2,823	3,000	2,512	-311	**-11.02**
2003	වාහන	400	397	600	586	189	**47.61**
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	**150**	**132**	**600**	**571**	**439**	**332.58**
2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	100	94	600	571	477	**507.45**
2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	50	38	0	0	-38	**-100.00**
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**1,000,000**	**1,000,000**	**750,000**	**750,000**	**-250,000**	**-25.00**
2302 -05	ගොවි නිෂ්පාදන මිලදී ගැනීමේ චක්‍රීය අරමුදල	1,000,000	1,000,000	750,000	750,000	-250,000	**-25.00**
	මානව සම්පත් සංවර්ධනය	**1,000**	**984**	**1,000**	**263**	**-721**	**-73.27**
2401	දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය	1,000	984	1,000	263	-721	**-73.27**

8. භෞතික කාර්යසාධනය

8.1 *මුදල් කළමනාකරණය*

8.1.1 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය

රාජ්‍ය මූල්‍ය ඵලදායි ලෙස කළමනාකරණය කිරීම, අයවැය ප්‍රතිපත්ති ඉලක්ක සපුරාලීම සහ ණය ගැනීමේ පිරිවැය අවම කිරීම යන අරමුණු තහවුරු කර ගැනීම සඳහා 2012 වර්ෂය තුලදීද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඵලදායී මූල්‍ය සැලසුම්කරණ සහ කළමනාකරණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වන්නේ ප්‍රමුඛතාවය පදනම් කරගෙන නිසි වේලාවට වියදම් දරන ආයතන (රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන) වෙත මුදල් නිදහස් කිරීමයි. සෑම විටම පවත්නා මුදල් ප්‍රමාණයට වඩා මුදල් සඳහා ඉල්ලුම වැඩි බව දෙපාර්තමේන්තුවේ අත්දැකීම විය. එම නිසා එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අවශ්‍යතාවයන් වඩාත් නිවැරදිව තක්සේරු කර වාර්ෂික අයවැය වඩා කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවුත් මුදල් නිදහස් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය අතරින් එක් සුවිශේෂ වගකීමක් විය.

මේ අයුරින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලද කළමනාකරණ උපක්‍රම, ණය ආපසු ගෙවීම ඒකරාශී වීම මගින් ඇතිවන්නාවූ රාජ්‍ය ණය නැවත් නිකුත් කිරීමේ අවදානම හා එමගින් දේශීය පොළී අනුපාතය මත ඇතිවිය හැකි පීඩනය මග හරවා ගැනීමට මහත් සේ ඉවහල් විනි. මෙම ක්‍රියාවලිය සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කරන ලද සමස්ත මුදල් ගලා ඒම, මුදල් ප්‍රවාහ ගලා යාමේ සීමාවන් හා ණය ගැනීම් වල කාල මත පදනම්ව ක්‍රියාකාරී මාසික මුදල් පුරෝකථනයන් පිළියෙල කරන ලදී. පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද විසර්ජන පනතට අනුකූලව සකසන ලද ප්‍රක්ෂේපිත කරන ලද මුදල් ගලා ඒම සහ ගලා යාම හා සැලසුම්කරන ලද ණය ගැනීමද ඇතුලත් වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව මෙම මාසික මුදල් ප්‍රවාහ පුරෝකථන සැලැස්ම පිළියෙල කරන ලදී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා සුරා බදු දෙපාර්තමේන්තුව විසින් සපයන ලද ඇස්තමේන්තු ගත ආදායම් විස්තර සහ පසුගිය මාසවල හැසිරීම් රටාවන් අනුව පිළියෙල කරන ලද බදු සහ බදු නොවන ආදායම් වියදම් වල විස්තර සැලකිල්ලට ගැනීමෙන් මෙම වාර්ෂික හා මාසික මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් පිළියෙළ කරන ලදී. ක්‍රියාකාරී මාසික මුදල් ප්‍රවාහය අඛණ්ඩව යාවත්කාලීන කිරීම තුලින්, රාජ්‍ය වියදම් ක්‍රමවත්ව කළමණාකරණය කිරීම හා රාජ්‍ය ආදායම් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2012 වසරේදී මනා දායකත්වයක් ලබා දී ඇත.

මුදල් ප්‍රවාහ කළමනාකරණය සහ 2012 වර්ෂයේ අයවැය ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට හා ආදායම් ඉලක්කයන් සමාලෝචනය සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2012 වර්ෂය තුලදී මුදල් ප්‍රවාහ රැස්වීම් 11 ක් පවත්වන ලදී. ප්‍රධාන ආදායම් උපයන දෙපාර්තමේන්තු වන දේශිය ආදායම්, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු යන දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ නිලධාරීන් මේ සඳහා සහභාගී විය.

වෙනත් වසර වලදි මෙන්ම 2012 වසරේදී ද භාණ්ඩාගාර ලැබීම් හා ගෙවීම් අතර පරතරය පියවා ගැනීම රාජ්‍ය ණය ගැනීම් වලින් සිදු කෙරිනි. 2012 වසර ණය ගැනීම් සිදුකිරිම සම්බන්ධයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට මහත් අභියෝගාත්මක වසරක් විය. රාජ්‍ය ආදායම් ඉලක්කයන් වෙත ලගා වීමේ දුෂ්කරතාවයන් හා ණය පොලී වියදම ඉහල යාම මත වුවද ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව හා එක්ව එම සියළු අභියෝගයන් සාර්ථකව ජය ගැනීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට මෙම වසරේදී හැකියාව ලැබිනි. එම අභියෝගයන් අතර,

1. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්තු මත අපේක්ෂා කළ ආර්ථික ඉලක්කයන්ට පටහැනි නොවන සේ භාණ්ඩාගාර මුල්‍ය ප්‍රවාහය කළමනාකරණය කිරිම.
2. රාජ්‍ය ආයෝජන වැඩ සටහන සැලසුම් කරන ලද පරිදි සිදු කිරීම.
3. පෞද්ගලික අංශයේ ණය අවශ්‍යතාවයන්ට බාධා නොවන අයුරින් දේශීය මුල්‍ය සම්පත් රාජ්‍ය අයෝජන සඳහා යොදා ගැනීම.
4. ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳ පොලෙහි අඩු පිරිවැය ණය ලබා ගැනීම් සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.
5. වාර්ෂික රාජ්‍ය ආයෝජන ඉලක්කයන් සපුරාගත හැකි වන පරිදි මාසික දේශීය ණය කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ණය ගැනිම් ප්‍රමාණ නිර්දේශ කිරීම.

8.1.2 භාණ්ඩාගාර මුදල් ලැබීම්

වගුව 8.1 (අ) ආදායම් එකතු කිරීම් - 2012 *(රු. මිලියන)*

	ඇස්තමේන්තු	තත්‍ය	වෙනස %
බදු ආදායම	994,559	833,520	84
බදු නොවන ආදායම	73,238	124,359	170
ප්‍රදාන	2,416	3,171	131
මුළු ආදායම	1,070,213	961,050	90

රූපසටහන 8.1 (අ) ඇස්තමේන්තුගත සහ තත්‍ය ආදායම 2012



ඉහත 8.1 (අ) වගුවෙන් හා 8.1 (අ) රූපසටහනෙන් පෙන්නුම් කරන ආකාරයට, 2012 වර්ෂය තුළ ඇස්තමේන්තු ගත ආදායමෙන් 90% ක ප්‍රමාණයක ආදායමක් එකතු කර ගෙන ඇත. මෙය ඇස්තමේන්තු ගත බදු ආදායමින් 84% ක ප්‍රතිශතයකින්ද ඇස්තමේන්තුගත බදු නොවන ආදායම් වලින් 170% ක ප්‍රතිශතයකින්ද ඇස්තමේන්තු ගත ප්‍රදාන වලින් 131% ප්‍රතිශතයකින්ද සමන්විත වේ.

ආර්ථික ක්‍රියාකාරකම් වල පහල යාම හා ආනයන අඩු විම රාජ්‍ය ආදායම රැස්කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදි. කෙසේ නමුදු ආදායම් රැස්කිරීමේ කටයුතු අධීක්ෂණය තීව්‍ර කිරීම මගින් 2012 වසරේ මහා භාණ්ඩාගාරයට රු. මිලියන 961,050 ක් රැස්කර ගැනීමට හැකිවූ අතර එය 2011 වසරේ එකතු කරන ලද ආදායම වන රු. මිලියන 885,549 හා සැසඳීමේදී 8.5% ක වැඩිවීමකි. මෙම වැඩිවීම බදු හා බදු නොවන ආදායම් යන දෙඅංශයෙන්ම සිදුවී ඇත. බදු ආදායම වැඩිවීමට ප්‍රධාන හේතුවක් වූයේ ආදායම මත පැනවූ බදු, සුරා බදු හා අනෙකුත් බදු මගින් ලබා ගන්නා ලද ආදායම් වර්ධනයයි. බදු නොවන ආදායම වැඩි වීමට හේතු වූයේ 2012 වසර තුලදී රජයේ ආයතන වලින් වැඩිපුර ලාභ හා ලාභාංශ රජය වෙත ලැබීමයි. මේ අනුව 2012 වසරේ මුළු ආදායමින් 87% ක් බදු ආදායමින්ද, 13% ක් බදු නොවන ආදායමෙන් හා ප්‍රදාන මගින් ලැබී ඇත.

බහු පාර්ශවීය මූල්‍ය ආයතන වලින් ලැබූ ප්‍රදාන අඩු විමත් යුරෝපා ප්‍රජාවෙන් ප්‍රදාන නොලැබීමත් හේතුවෙන් 2011 වසරට සාපේක්ෂව 2012 වසරේදි භාණ්ඩාගාර මුදල් ප්‍රවාහය සඳහා ලැබුණ විදේශ ප්‍රදාන රුපියල් මිලියන 3,171 ක් දක්වා 2.9% කින් අඩු විය.

8.1.3 භාණ්ඩාගාර මුදල් නිදහස් කිරීම

රාජ්‍ය ආයෝජන ඉහල නැංවීම සඳහා පුනරාවර්ථන වියදම් පාලනය කිරිමේ හා ප්‍රාග්ධන වියදම් අවශ්‍ය මට්ටමේ පවත්වාගෙන යාමේ රජයේ ප්‍රයත්නයට උපරිම දායකත්වයක් සපයමින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2012 වසරේදී මුදල් නිදහස් කිරීම් සිදු කරන ලදී.

මෙහිදි එක් අභියෝගයක් වූයේ ණය ගැනීම් වෙනුවෙන් ගෙවිය යුතු පොලිය ද ඇතුළුව රජයේ පුනරාවර්ථන වියදම් සහ රජයේ ආදායම සමකිරීමයි. පහත 8.1 (ආ) ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරනු ලබන්නේ වර්ෂය මුලුල්ලේ තත්‍ය සමුච්චිත ආදායම , සමුච්චිත පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් සඳහා නිදහස් කර ඇති ආකාරය හා බැංකු අයිරාව කෙරෙහි එය බලපා ඇති ආකාරයයි.

රූප සටහන 8.1 (ආ) මුදල් ගලා ඒම සහ ගලා යාම



(රු.මිලියන)

	සමු.ආදායම	සමු.පුනරාවර්තන	බැංකු අයිරා	සමු.ප්‍රාග්ධන
ජනවාරි	73,083	71,254	92,016	27,994
පෙබරවාරි	140,460	116,686	105,357	36,844
මාර්තු	223,964	166,590	76,939	48,968
අප්‍රේල්	300,681	221,656	92,534	71,647
මැයි	380,724	279,429	88,291	91,823
ජුනි	480,181	331,366	68,174	101,984
ජුලි	547,459	407,950	44,251	140,288
අගොස්තු	621,826	458,890	103,435	152,334
සැප්තැම්බර්	702,717	507,823	98,107	159,902
ඔක්තෝබර්	783,650	560,476	122,914	177,625
නොවැම්බර්	864,321	611,742	133,673	195,313
දෙසැම්බර්	961,050	659,221	144,480	203,500

8.1 (ආ) රූප සටහන අනුව 2012 වර්ෂය මුළුල්ලේම රජයේ පුනරාවර්ථන වියදම් ඉක්මවා රජයේ ආදායම් එකතු කිරිම කර ඇති අතර , පුනරාවර්ථන වියදමට සාපේක්ෂව ඇති අතිරේක ආදායම ප්‍රාග්ධන වියදම් සඳහා හා රාජ්‍ය ණය කොටසක් ආපසු ගෙවීම් සඳහා යොදවා ඇත.පෙර වසරට සාපේක්ෂව 2012 වසරේදී පුද්ගල පඩි නඩි , විශ්‍රාම වැටුප් හා පොලී ගෙවීම් වෙනුවෙන් වැඩිපුර පුනරාවර්ථන වියදම් සඳහා අක්මුදල් නිදහස් කිරිමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට සිදුවිය.

යටිතල පහසුකම් සංවර්ධනය කිරිමේ ව්‍යාපෘති වේගවත් කිරිම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන මුදල් නිදහස් කිරිම් සඳහා කිසිදු ප්‍රමාදයකින් තොරව මුදල් නිදහස් කිරිමට 2012 වසරේදි භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සියළු පියවර ගන්නා ලදි.මේ අනුව 2012 රාජ්‍ය ආයෝජන වැඩ සටහන ක්‍රියාත්මක කිරිම සඳහා රුපියල් මිලියන 203,500 ක මුදලක් 2012 වසරේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහය තුලින් සපයා දී ඇත. මෙම මුදල් සැපයීමේදි රටේ මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරිම , ප්‍රවාහන සේවා පුළුල් කිරිම , ගම නැගුම වැඩ සටහන , සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන , වරාය , වාරිමාර්ග , කෘෂිකාර්මික , බලශක්ති , අධ්‍යාපන සෞඛ්‍ය , ජලසම්පාදන යන අංශයන්හි රාජ්‍ය ආයෝජනයන් සඳහා මුදල් නිදහස් කිරිම් සිදුකර ඇත.

8.1.4 මුදල් සීමාවන් හා නිදහස් කිරිම් වල සංයුතීන්

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මුදල් කළමනාකරණ අංශය අංශ පහකට වෙන් කර ගෙන ඇති අතර , ඒ අනුව නිදහස් කිරිම කරනු ලැබේ එම අංශ පහ වනුයේ ,

1. යටිතල පහසුකම් සංවර්ධන අංශය (IDS)
2. මානව සම්පත් සංවර්ධන අංශය (HRD)
3. මුර්ත ආර්ථික හා මුල්‍ය අංශය (RES)
4. ආරක්ෂක අංශය (DEF)
5. රාජ්‍ය පාලන අංශය (GOV) යි .

රූප සටහන **8.1 (ඇ)** වාර්ෂික මුදල් සීමාවන් සහ වාර්ෂික මුදල් නිදහස් කිරීම් - **2012**



(රු.මිලියන)

	යටිතල පහසුකම්	මානව සම්පත්	මූර්ත ආර්ථික	ආරක්ෂක	රාජ්‍ය පාලන
සීමාව	112,473	140,540	153,268	258,622	340,131
නිදහස් කිරීම	78,409	127,312	114,460	249,725	298,302
නිදහස් කිරීමේ ප්‍රතිශතය	**70%**	**91%**	**75%**	**97%**	**88%**

8.1 (ඇ) රූපසටහනේ පෙන්නුම් කරන ආකාරයට සෑම අංශයක් වෙනුවෙන්ම ප්‍රමාණවත් ලෙස මුදල් නිදහස් කිරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු 2012 වසරේදි කටයුතු කර ඇත. මෙහිදි මානව සම්පත් සංවර්ධන , ආරක්ෂක සහ රාජ්‍ය පාලන අංශ සඳහා 88% කට වැඩි මුදල් ප්‍රමාණයක් නිදහස් කිරීමක් සිදු කර ඇත. මූර්ත ආර්ථික හා යටිතල පහසුකම් අංශ සඳහා පිළිවලින් 75% හා 70% ලෙස මුදල් නිදහස් කර ඇත.

රූප සටහන 8.1 (ඈ) රජයේ පුනරාවර්තන වියදම් සඳහා මුදල් සීමාවන් හා නිදහස් කිරිම් 2012



රූප සටහන 8.1 (ඉ) රජයේ ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් සීමාවන් හා නිදහස් කිරිම් 2012



වගුව 8.1 (ආ) පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා ආංශික අග්‍රිම සීමා හා නිදහස් කිරිම

(රු.මිලියන)

අංශය	පුනරාවර්තන වියදම්			ප්‍රාග්ධන වියදම්(රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් හැර)		
	මුදල් සීමාව	මුදල් නිදහස් කිරිම	%	මුදල් සීමාව	මුදල් නිදහස් කිරිම	%
යටිතල පහසුකම්	23,979	17,291	72	87,074	60,864	70
මානව සම්පත්	109,468	108,302	99	28,927	18,045	62
මුර්ත ආර්ථික	73,119	67,824	93	78,770	46,199	59
ආරක්ෂක	223,658	224,558	100	29,324	21,775	74
රාජ්‍ය පාලන	250,714	241,246	96	87,710	56,616	65
එකතුව	**680,939**	**659,221**	**97**	**311,805**	**203,500**	**65**

වගුව 8.1 (ඇ) හි දැක්වෙන පරිදි වියදම් ආයතන වල පුනරාවර්තන වියදම් සඳහා වන මුදල් අවශ්‍යතාවයන් ප්‍රශස්ත මට්ටමින් නිදහස් කර ඇත.වෙනත් ආකාරයෙන් පවසන්නේ නම් එය වාර්ෂික අයවැය පදනම් කරගෙන සකස් කරන ලද මුළු මුදල් අවශ්‍යතා සීමාවෙන් 97% ක ප්‍රතිශතයකි.රජයේ පුනරාවර්තන වියදම් සඳහා මුදල් නිදහස් කිරිමේදි මානව සම්පත් සංවර්ධන , ආරක්ෂක හා රාජ්‍ය පාලන අංශ සඳහා 96% කට නොඅඩු ප්‍රතිශතයකින් මුදල් නිදහස් කර ඇත.

පසුගිය වර්ෂයේ 71% ක් වු ප්‍රාග්ධන වියදම් හා සැසදිමේදි රජයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් සීමාවෙන් 65% ක් දක්වා මුදල් නිදහස් කිරිමට භාණ්ඩාගාරයට හැකිවිය.මෙම මුළු ප්‍රාග්ධන වියදම් නිදහස් කිරිම් 65% ක අගයක් පෙන්නුම් කලද , භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව රාජ්‍ය පාලන අංශය යටතේ වන සීමාවෙන් 65% ප්‍රතිශතයක් එම අංශය යටතේ වන සියළුම දිස්ත්‍රික්කවල ප්‍රාග්ධන වියදම් සඳහා නිදහස් කර ඇත.වැඩිම මුදල් නිදහස් කිරිම වන 74% ප්‍රමාණය ආරක්ෂක අංශයේ ප්‍රාග්ධන වියදම් සඳහා නිදහස් කර ඇත.

8.1.5 අක්මුදල් සීමාවන් හා තත්‍ය මුදල් නිදහස් කිරිම සම්බන්ධ ආංශික සංයුතියන්

අයවැය සකස් කරන අවස්ථාවේදි ආර්ථිකයේ වැදගත් අංශ සඳහා සම්පත් වෙන් කිරිමේදි ප්‍රමුඛතාවයන් දෙනු ලැබේ. මහා භාණ්ඩාගාරයේ අයවැය ක්‍රියාත්මක කිරිමේ යාන්ත්‍රණය වශයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මුදල් නිදහස් කිරිමේදි එම වැදගත්කම හා ප්‍රමුඛතාවයන්

විශේෂ කොට සලකනු ලැබේ.ඒ අනුව 8.1 (ඊ) රූපසටහන් මගින් දැක්වෙන ආංශික සංයුතීන් අනුව රජයේ පුනරාවර්තන වියදම් , රජයේ ප්‍රාග්ධන වියදම් , රජයේ නිලධාරින්ට අත්තිකාරම් සඳහා 2012 වසරේ මුදල් නිදහස් කිරිම සිදුකර ඇත.

රූපසටහන 8.1 (ඊ) ආංශීය සංයුතිය අනුව අරමුදල් සීමා සහ අරමුදල් නිදහස් කිරිම් - 2012



8.2 රජයේ ණය කළමනාකරණය

8.2.1. රජයේ ණය කළමනාකරණ උපාය මාර්ග

- 2003 අංක 3 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ ප්‍රතිපාදන ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණයේ මධ්‍ය කාලීන ගමන් මඟ සකස් වී ඇත. මෙම පනත මඟින් රජයේ අයවැය හිඟය මධ්‍ය කාලීනව දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 5 ක් දක්වා අඩු කිරීමත් එතැන් සිට එම මට්ටමේ පවත්වා ගෙන යාමටත් දළ දේශීය නිෂ්පාදිතයට ණය අනුපාතය 2013 දී සියයට 80 ක් දක්වාත් 2020 දී සියයට 60 දක්වාත් අඩු කිරීමට අපේක්ෂිතය.
- මෙම නීතිමය රාමුව හා අනුගත වෙමින් රජයේ ණය ගැනීමේ උපාය මාර්ග මෙහෙයවන ප්‍රධාන මූලධර්ම ලෙස වර්තන වියදම් කළමනාකරණය කරමින් රජයේ ආයෝජන පිළිගත හැකි මට්ටමක පවත්වා ගෙන යාම, පවත්නා ණය සේවාකරනය සඳහා ප්‍රමාණවත් අරමුදල් පැවතීම තහවුරු කරමින් අවම පිරිවැයක් මත ණය ගැනීම කෙරෙහි මූලික අවධානය යොමු වී ඇත.

රූපසටහන 8.2 (අ) රාජ්‍ය ණය සංයුතිය



- රාජ්‍ය අයවැයෙහි සම්පත් පරතරය මූල්‍යනය කිරීම සඳහා ණය ගැනීම් අවශ්‍යතාවය සමඟ දේශීය හා විදේශීය මූල්‍යන මාර්ග මත රඳා පැවැත්ම කාලීනව ඉහළ ගොස් ඇත. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රජයේ මුළු ගෙවිය යුතු ණය අනුපාතය හීනවීමේ ප්‍රවනතාවය මෑත කාලීනව සුළු වෙනසක් නිරූපනය කරයි. ශ්‍රී ලංකා රුපියල, ප්‍රධාන විදේශ මුදල් වලට එරෙහිව අවප්‍රමාණය වීම මෙයට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැකිය.

- රාජ්‍ය ණය අවදානම අඩු කරමින් රජයේ සුරැකුම්පත් වෙළඳපොල සංවර්ධනය කිරීම කෙරෙහි රජයේ ණය කළමනාකරණ උපාය මාර්ග යොමු වීමත් සමඟ, 2012 වර්ෂයේ සම්පත් පරතරය මූල්‍යනය කිරීම සඳහා දිගුකාලීනව කල්පිරෙන ගනුදෙනු කල හැකි ණය උපකරණ මත වඩාත් නැඹුරු වී ඇත. ඒ අනුව දේශීය ණය ලබාගැනීම් වෙළඳපොල තුල ගනුදෙනු කල හැකි ණය උපකරණ කෙරෙහි වඩාත් නැඹුරු වීමත් විදේශිකයින්ට රුපියල් අගයෙන් භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වල ආයෝජනය කිරීමට අවස්ථාව යම්කිසි ඉහළ සීමාවන්ට යටත්ව ලබා දීමත් හේතුවෙන් ණය ලබා ගැනීමේ ව්‍යුහයද වෙනස් වී ඇත.

8.2.2. ණය ගැනීමේ වැඩසටහන – 2012

- රජයේ සම්පත් පරතරය මූල්‍යනය සඳහා වන ණය ගැනීම් වාර්ෂිකව විසර්ජන පනත මඟින් ප්‍රතිපාදිත නීතිමය ප්‍රතිපාදන මත සිදු කෙරේ. ඒ අනුව 2011 වර්ෂයේදී අංක 52 දරන විසර්ජන පනත මඟින් පාර්ලිමේන්තුව විසින් 2012 වර්ෂයේ සම්පත් පරතරය පියවීම සඳහා රුපියල් බිලියන, 1139 ක දළ ණය සීමාවක් සලසා දී ඇත.
- 2012 වර්ෂයේදී සමස්ථ අයවැය හිඟය වූ රුපියල් බිලියන 489 න් සියයට 63 ක් එනම් රුපියල් බිලියන 308 ක් ශුද්ධ දේශීය ණය මඟින් මූල්‍යනය කරන ලදි.

8.2.3. දේශීය ණය මූල්‍යනය

ගනුදෙනු කළ හැකි ණය උපකරණ භාවිතය හා රජයේ සුරැකුම්පත් වෙළඳපල සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තිය අනුව යමින් 2012 වර්ෂය තුලදී දේශීය ණය මූල්‍යනය මූලික වශයෙන් ගනුදෙනු කල හැකි ණය උපකරණ මඟින් සිදු කරන ලදි.

ඒ අනුව විදේශිකයන් විසින් 2012 වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කරන ලද රුපියල් බිලියන 99.6 ද ඇතුලත්ව රුපියල් බිලියන 254.2 ක් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මඟින් රැස්කරගන්නා ලදි. මෙය සමස්ථ ශුද්ධ දේශීය මූල්‍යනයෙන් සියයට 82.5 ක් නිරූපනය කරයි

රූපසටහන 8.2 (ආ) ශුද්ධ දේශීය මූල්‍යනයේ උපනතීන්



2012 වර්ෂයේදී විදේශිකයින් විසින් භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද ආයෝජනය වූ රුපියල් බිලියන 6 ද ඇතුලත්ව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මගින් රුපියල් බිලියන 22.8 ක් ලබා ගන්නා ලදි. මෙය මුළු ගනුදෙනු කල හැකි ණය වලින් සියයට 7.8 ක් නිරූපනය කරන අතර සමස්ථ ශුද්ධ දේශීය මූල්‍යනයන්ගෙන් සියයට 7.4 කි. 2011 වර්ෂයේදී ලබා ගන්නා ලද රුපියල් බිලියන 5.3 ට සාපේක්ෂව 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් රුපියල් බිලියන 18.4 ක් ලබාගන්නා ලද අතර එය සමස්ථ ශුද්ධ දේශීය මූල්‍යනයන්ගෙන් සියයට 6 කි.

ශුද්ධ දේශීය මූල්‍යනය තුල මධ්‍ය කාලයේ සිට දිගු කාලය තෙක් ණය 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂය තුලදී සියයට 62.6 සිට සියයට 87.3 තෙක් රුපියල් බිලියන 269 දක්වා ඉහල ගොස් ඇති අතර කෙටිකාලීන ණය 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂය තුලදී සියයට 37.4 සිට සියයට 12.7 තෙක් අඩුවී ඇත.

8.2.3.1. නොපියවූ දේශීය ණය

රුපියල් අගයෙන් විදේශීය ආයෝජකයින් වෙත නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර හැර මුළු දේශීය ණය 2012 වර්ෂය අවසාන වන විට රුපියල් බිලියන 3,232.8 ක් ලෙස සටහන් විය. මෙය 2011 වර්ෂාවසානයට පැවති රුපියල් බිලියන 2,804.1 ක මුළු ණය ප්‍රමාණයට සාපේක්ෂව සියයට 15.3 ක එනම් රුපියල් බිලියන 428.7 ක වැඩිවීමකි. දේශීය ප්‍රභවයන්ගෙන් ණය ගැනීම කෙරෙහි අඩු බරක් නිරූපනය කරමින් පෙර වර්ෂයේ පැවති සියයට 54.6 ට සාපේක්ෂව 2012 වසර අවසාන වන විට මුළු ණය මත දේශීය ණය අනුපාතය සියයට 53.9 ක් දක්වා අඩුවී ඇත. 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂය තුලදී දළ දේශීය නිෂ්පාදනයට ප්‍රතිශතයක් ලෙස මුළු දේශීය ණය ප්‍රමාණය සියයට 42.9 සිට සියයට 42.6 තෙක් අඩුවී ඇත.

2012 වර්ෂය අවසානයට පැවති නොපියවූ මුළු දේශීය ණය ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 64.8 හා සියයට 19.4 ක් භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් නිරූපනය කරයි. ශේෂය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (සියයට 6.9) ක්, ශ්‍රී ලංකා මහ බැංකු තාවකාලික අත්තිකාරම් (සියයට 3.4), රුපියල් ණය (සියයට 1.9) ක් සහ වෙනත් (සියයට 3.6) ක් මගින් සමන්විත වේ.

වසරකට වඩා වැඩි කාලයකදී කල්පිරෙන මධ්‍ය හා දිගු කාලීන ණය 2012 වර්ෂයේදී මුළු දේශීය ණය ස්කන්ධයෙන් සියයට 74.8 ක් ලෙස සටහන් විය. මෙය කෙටි කාලීන ණයෙහි සාමාන්‍ය වර්ධනය හේතුවෙන් පෙර වර්ෂයෙහි පැවති සියයට 75.1 ට සාපේක්ෂව සුළු අඩු වීමක් පෙන්නුම් කරයි.

8.2.3.2 දේශීය ණය කල්පිරීමේ ව්‍යුහය

2012 වසර අවසානයට පැවති නොපියවූ සමස්ත දේශීය ණය ස්කන්ධයෙන් රුපියල් බිලියන 1,415 ක් එනම් සියයට 43.8 ක් 2013 වසර තුල කල්පිරීමට නියමිත ණය වේ. දිගුකාලීන පරිනතීන් සහිත ගනුදෙනු කල හැකි ණය උපකරණ කෙරෙහි ඇති රඳා පැවැත්ම හේතුවෙන් දේශීය ණයෙහි පරිනතිය තෙක් සාමාන්‍ය කාලය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 2.35 සිට සියයට 3.25 තෙක් ඉහල ගොස් ඇත.

වගුව 8.2 (අ) දේශීය ණය කල්පිරීමේ ව්‍යුහය - 2012 අවසානයට **(රුපියල් මිලියන)**

කල්පිරෙන වසර	භාණ්ඩාගාර බිල්පත්	භාණ්ඩාගාර බැඳුම්කර	රුපියල් ණය	ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	විදේශීය බැංකු ඒකක	වෙනත් (ශුද්ධ තැන්පතු)	එකතුව	පරිනතිය සමස්තයේ % ලෙස
2013	629,070	460,207	2,868	95,380	19,870	207,439	1,414,834	43.8
2014		323,405		40,818			364,223	11.3
2015		314,013	31,430	75,097			420,540	13.0
2016		204,069		11,699			215,768	6.7
2017		184,756					184,756	5.7
2018		203,834					203,834	6.3
2019		108,944					108,944	3.4
2020		80,899					80,899	2.5
2023		74,463	24,088				98,551	3.0
2026		60,365					60,365	1.9
2027		58,712					58,712	1.8
2028		21,387					21,387	0.7
එකතුව	**629,070**	**2,095,054**	**58,386**	**222,994**	**19,870**	**207,439**	**3,232,813**	**100.00**

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාරත්මේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් නිකුත් කල බැඳුම්කර සහ බැංකු අයිරාවද, හැර

අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා අරමුදල් සපයා ගැනීමේ මාර්ගයන් ලෙස ගනුදෙනු කළ හැකි ණය උපකරණ වෙත යොමුවීම සඳහා වන රජයේ උපාය මාර්ග නිරූපනය කරමින් 2011 වර්ෂය අවසානයට පැවති රුපියල් බිලියන 2,594 සාපේක්ෂව 2012 වර්ෂය අවසාන වනවිට රුපියල් බිලියන 2,947 දක්වා සියයට 11.8 කින් වර්ධනය වී ඇත. ගනුදෙනු කළ හැකි ණය භාණ්ඩාගාර බිල්පත්**,** භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වලින් සමන්විත වේ.

ඒ අනුව මුළු නොපියවී ඇති ණය ස්කන්ධයෙන් සියයට 91.2 ක් ගනුදෙනු කළ හැකි ණය උපකරණ මඟින් සමන්විත වූ අතර සියයට 8.8 ක් එනම් රුපියල් බිලියන 285.7 ක් ගනුදෙනු කල නොහැකි ණය උපකරණ වලින් සමන්විත විය.

8.2.3.3 දේශීය ණය සේවා ගෙවීම්

2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂය තුලදී දේශීය ණය සේවා ගෙවීම් 0.7% ක දළ වර්ධනයක් නිරූපණය කරයි. මුළු ණය සේවා ගෙවීම් වලින් රුපියල් බිලියන 733.1 ක් දේශීය ණය සේවා ගෙවීම් වන අතර, එයින් රුපියල් බිලියන 415.4 ක් එනම්, සියයට 56.2 ක් දේශීය ණය ආපසු ගෙවීම් වන අතර ඉතිරි රුපියල් බිලියන 317.7 (සියයට 43.8) පොළී ගෙවීම් සඳහා විය.

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ණය ආපසු ගෙවීම් සහ පොළී ගෙවීම් වල පහල යාමක් නිරූපණය කරමින් මුළු දේශීය ණය සේවා වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස 2011 වර්ෂයට සාපේක්ෂව සියයට 11.1 සිට 2012 දී සියයට 9.7 තෙක් පහළ වැටී ඇත.

දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ණය ආපසු ගෙවීම් වර්ෂය තුලදී, පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 6.7 සිට 5.5 තෙක් අඩු වී ඇති අතර පොළී ගෙවීම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 4.2 සිට 4.4 තෙක් ඉහළ ගොස් ඇත.

වගුව 8.2 (ආ) දේශීය ණය සේවා ගෙවීම්

(රුපියල් මිලියන)

වර්ෂය	ණය ආපසු ගෙවීම්	පොළී ගෙවීම්	එකතුව
2001	44,074	84,560	128,634
2002	130,786	105,897	236,683
2003	185,083	113,540	298,623
2004	147,740	105,878	253,618
2005	203,347	113,164	316,511
2006	247,536	133,787	381,323
2007	252,165	161,370	413,535
2008	258,720	182,198	440,918
2009	401,296	273,977	675,273
2010	389,672	297,127	686,799
2011	439,894	288,134	728,028
2012	415,441	317,659	733,100

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

8.3 විදේශාධාර කළමනාකරණය

ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා අග්‍රිම මුදල් නිදහස් කිරීම ව්‍යාපෘතිවල බැංකු ගිණුම්වලට සෘජුවම හෝ එම ව්‍යාපෘති අයත්වන අමාත්‍යාංශ හරහා සිදු කරනු ලැබේ. 2012 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර යටතේ රුපියල් මිලියන 4,292 ක මුදලක් නිදහස් කර ඇත. (2012 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ රුපියල් මිලියන 3,059 ක වටිනාකමකින් යුත් ද්‍රව්‍ය හා උපකරණ ලැබීම් වලට අමතරව විදේශාධාර මූල්‍ය ප්‍රදාන වශයෙන් රුපියල් මිලියන 13,011 ක මුදලක් රජයට ලැබී ඇත.)

ණය ප්‍රදායක ආයතන ශ්‍රී ලංකාවට සෘජුව ලබා දෙන අරමුදල් ලබාගැනීම පහසු වනු පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අග්‍රිම අරමුදල් ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. 2012 වසර තුළදී මෙවැනි ගිණුම් 16 ක් අලුතින් ආරම්භ කිරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව කටයුතු යොදා ඇති අතර, 2012 වසර අවසාන වන විට, වසර තුළ ක්‍රියාත්මක වූ එවැනි ගිණුම් සංඛ්‍යාව 121 කි. මෙම ගිණුම් වලට 2012 වසර තුලදී ණය ප්‍රදායක ආයතන වලින් රුපියල් මිලියන 41,135 ක මුදලක් ලැබී ඇත.

8.4 රාජ්‍ය ආදායම

8.4.1 ආදායම් රැස්කිරීම

භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් බදු ආදායම් ශීර්ෂ 01 ක හා බදු නොවන ආදායම් ශීර්ෂ 11 ක ගණන් දීමේ නිලධාරි ලෙස ක්‍රියාකරයි. ඒ අනුව, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී රුපියල් බිලියන 158.7 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද රජයේ මුළු බදු නොවන ආදායමෙන් 30% ක් නැතහොත් රුපියල් බිලියන 47.7 ක් යථෝක්ත බදු නොවන ආදායම් ලෙස අයකර ගැනීමට සැළසුම් කරන ලද අතර, ඉහත බදු ආදායම යටතේ රුපියල් බිලියන 22.9 ක මුදලක් අයකර ගැනීමට අපේක්ෂා කරන ලදී. ඒ අනුව අදාල වර්ෂය තුලදි බදු නොවන ආදායම ලෙස රුපියල් බිලියන 41 ක් සහ බදු ආදායම ලෙස රුපියල් බිලියන 22.3 ක් උපයා ගැනීමට මෙම දෙපාර්තමේන්තුවට හැකිවිය.

ඉහත ආදායම් ශීර්ෂ 12 ට අදාලව වර්ෂ 2011 – 2012 දක්වා තොරතුරු වගුව 8.4 (අ) මඟින් දැක්වේ

වගුව 8.4 (අ) බදු නොවන සහ බදු ආදායම් රැස් කිරීම 2011 – 2012

ආදායම් විස්තරය	ආදායම් රැස් කිරීම			රුපියල් දහස් ගණනින්
	2011		2012	
	ඇස්තමේන්තුව	රැස්කිරීම	ඇස්තමේන්තුව	රැස්කිරීම
බදු නොවන ආදායම්				
රජයේ ගොඩනැගිලි කුලී	690,000	663,387	650,000	582,264
අනෙකුත් කල්බදු කුලී	60,000	662,160	62,000	50,139
උපණය සඳහා පොලී	6,775,000	7,293,475	7,704,000	8,100,516
වෙනත් පොලී ආදායම්	1,3000,000	2,553,028	1,325,000	1,387,711
දෙපාර්තමේන්තු විකුණුම්	100,000	137,491	130,000	143,436
විවිධ පරිපාලනාත්මක ගාස්තු	5,500,000	6,502,094	7,114,582	2,941,497
දඩ හා රාජසන්තක කිරීම්	2,800,000	6,264,217	3,000,000	5,137,117
අනෙකුත් ලැබීම්	8,500,000	12,711,008	9,042,000	3,238,911
අනෙකුත් වර්ථන පැවරීම්	1,485,000	1,953,084	1,800,000	2,222,737
ප්‍රාග්ධන වත්කම් විකිණීම	500,000	514,298	500,000	831,152
ණය ආපසු අයකිරීම	14,772,000	14,877,713	16,470,000	16,409,105
මුළු එකතුව	**42,482,000**	**54,131,955**	**47,797,582**	**41,044,585**
බදු ආදායම්				
දුරකථන ග්‍රාහක බද්ද	20,500,000	18,650,864	22,900,000	22,289,141
මුළු එකතුව	**20,500,000**	**18,650,864**	**22,900,000**	**22,289,141**
මුළු ආදායම	**62,982,000**	**72,782,819**	**70,697,582**	**63,333,726**

තවද විදේශ ප්‍රදාන ලැබීම් සම්බන්ධව ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරනු ලබයි. මේ යටතේ වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම රුපියල් බිලියන 20 ක් වූ අතර, වර්ෂය තුල ලද ආදායම රුපියල් බිලියන 16 ක් විය.

වගුව 8.4 (ආ) විදේශ ප්‍රදාන රැස්කිරීම

ආදායම් විස්තරය	ආදායම් රැස්කිරීම රුපියල් දහස් ගණනින්			
	2011		**2012**	
	ඇස්තමේන්තුව	**රැස්කිරීම**	**ඇස්තමේන්තුව**	**රැස්කිරීම**
විදේශ ප්‍රදාන	13,750,000	15,961,635	20,000,000	16,070,772
මුළු එකතුව	**13,750,000**	**15,961,635**	**20,000,000**	**16,070,772**

ඉහත තොරතුරුවලට අනුව 2012 වර්ෂයේ ඇස්තමේන්තු කරන ලද බදු නොවන ආදායමින් 86% ක් රැස් කර ගැනිමට හැකිවිය. නමුත්, පසුගිය වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදි මෙම ආදායම 24% ක සැළකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරයි. වෙනත් ලැබීම් හා විවිධ ආදායම් ලැබීම් වල පවතින ආවේනික ලක්ෂණ අනුව සමහර වර්ෂ වල ඉහල අගයක් හා සමහර වර්ෂ වල සමාන්‍ය අගයක් ගැනීම මේ සඳහා හේතු වී ඇත.

2012 වර්ෂයේ දූරකථන ග්‍රාහක බද්දේ ඉලක්කගත ආදායම වන රුපියල් බිලියන 22.9 ට එරෙහිව 98% ක කාර්ය සාධනයක් අත්කර ගෙන ඇති අතර 2011 වසරෙහි සමස්තය වන රුපියල් බිලියන 18.65 ට සාපේක්ෂව 19.52% කින් ඉහල ගොස් ඇත. මෙයට අමතරව, විදේශ ප්‍රදානයන් යටතේ ඇස්තමේන්තු කළ මුදල වන රුපියල් බිලියන 20 න් 88% ක ආදායමක් රැස්කර ඇති අතර එය 2011 වසරේ රැස්කළ රුපියල් බිලියන 16 ට සමානය. යුරෝපිය රටවල් මුහුණ දුන් ආර්ථික අර්බුද හේතුවෙන් විදේශ ප්‍රදාන නොමැතිවිම නිසා මෙම විෂමතාවය සිදු වී ඇති බව නිරික්ෂණය වේ.

8.4.2. උපණය වාරික මුදල් සහ පොලිය

දෙපාර්තමේන්තුව විසින් උප ණය ගෙවීම් හා අයකිරීම් සම්බන්ධව මාසිකව යාවත්කාලීන කරනු ලබන තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යනු ලැබේ. බදු නොවන ආදායම් ශීර්ෂ 11 අතුරින් උප ණය වාරික අයකිරීම හා පොලී රැස්කිරිම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකිමකි. මෙම ආදායම් තක්සේරු කිරිම, එකතු කිරිම සහ ප්‍රතිග්‍රහණය කරනු ලබනුයේ මෙම දෙපාර්තමේන්තුවෙනි.

2012 වර්ෂය තුළ උප ණය වශයෙන් රුපියල් බිලියන 37.8ක් නිදහස් කර ඇති අතර, රුපියල් බිලියන 16.4 ක් ණය වාරික ලෙස ආපසු අයකරගෙන ඇත. මීට අමතරව උප ණය වාරික පොලී ආදායම වශයෙන් රුපියල් බිලියන 8. 1ක්ද අයකර ගෙන ඇත.

ණය අයකිරීම් ක්‍රියාවලිය සමීපව අධීක්ෂණය කිරීම නිසා උප ණය වාරික හා පොලී එකතු කිරීම සම්බන්ධ 2012 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට මෙම දෙපාර්තමේන්තුවට හැකිවී තිබේ. 2012 වර්ෂය අවසානයට උප ණය ශේෂය රුපියල් බිලියන 323 ක්වූ අතර රාජ්‍ය ව්‍යාපාර, වාණිජ බැංකු, සංවර්ධන බැංකු, ග්‍රාමීය සංවර්ධන බැංකු ඇතුළු විවිධ ආයතන 83 ක් වෙත ණය මෙම ණය ලබාදී ඇත.

8.4.3 ඇපකර සහ සහන ලිපිමත අසම්භාව්‍ය බැරකම්

8.4.3.1භාණ්ඩාගාර ඇපකර

රාජ්‍ය ව්‍යවසායන් සිය මූලධන සහ වාණිජමය අරමුණු වෙනුවෙන් දේශීය හා විදේශීය මූල්‍යායතන වෙතින් අරමුදල් සම්පාදනය කර ගැනිමේදී ඒ සඳහා අවශ්‍ය වන භාණ්ඩාගාර ඇපකර, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ විධිවිධානවලට යටත්ව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබේ.

ඒ අනුව 2012.12.31 දින වනවිට රුපියල් මිලියන 266,074 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබුණි. එම ප්‍රමාණය පසුගිය වර්ෂයේ පැවති රුපියල් මිලියන 198,135 ක වටිනකම හා සැසඳීමේදි 35% ක පමණ වැඩිවීමකි. අදාල වර්ෂය තුළදී රුපියල් මිලියන 81,849 ක් වටිනා ඇපකර නිකුත් කර ඇත. මේ දක්වා නිකුත් කර ඇති ඇපකර වලින් 71% ක් නිකුත් කර ඇත්තේ විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය වෙත වේ. භාණ්ඩාගාර ඇපකරවල ආංශික සංයුතිය වගුව 8.4 (ඇ) මඟින් දක්වා ඇත.

වගුව 8.4 (ඇ) භාණ්ඩාගාර ඇපකරවල ආංශික සංයුතිය 2011 සහ 2012

අංශය	වටිනාකම රු. මිලියන		ප්‍රතිශතය %	ප්‍රතිශතය %
	2011	2012	2011	2012
ගුවන්සේවා	1,804	22,544	1	8
බැංකු	5,000	5,000	2	2
මාර්ග සංවර්ධන	18,880	27,442	9	10
නිවාස	2,855	20,405	2	8
විදුලිබල හා බලශක්ති	168,207	189,294	85	71
වෙළඳ හා වාණිජ	1,389	1,389	1	1
එකතුව	**198,136**	**266,074**	**100**	**100**

රූපසටහන 8.4 (අ) භාණ්ඩාගාර ඇපකර ආංශික සංයුතිය 2012



8.4.3.2 සහන ලිපි

ණයවර ලිපි විවෘත කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් සහන ලිපි නිකුත් කරන අතර, 2012.12.31 දින වන විට රුපියල් මිලියන 27,743 ක සහන ලිපි නිකුත් කර ඇත. මෙය පෙර වර්ෂයේ සහන ලිපි මත ශේෂය වූ රුපියල් මිලියන 27,661 ක් හා සැසදීමේදී 1% ක වර්ධනයකි. සහන ලිපි වල ආංශික සංයුතිය වගුව 8.4 (ඇ) මඟින් දක්වා ඇත.

වගුව 8.4 (ඇ) සහන ලිපිවල ආංශික සංයුතිය - 2012

අංශය	වටිනාකම රු. මිලියන		ප්‍රතිශතය %
	2011	**2012**	
ආරක්ෂක	7,704	12,627	45
කෘෂිකර්ම	13,952	872	3
අධ්‍යාපන	1,006	3	1
යටිතල පහසුකම්	1,546	10,072	36
අනෙකුත්	216	4,169	15
එකතුව	**27,661**	**27,743**	**100**

රූපසටහන 8.4 (ආ) සහන ලිපිවල ආංශික සංයුතිය - 2012



8.4.4 දේපළ ණය ඇපකර අරමුදල

රජයේ සේවකයින් හට වටිනා වත්කමක් අත්කර ගැනීමට සහතිකවීම අරමුණින් රාජ්‍ය බැංකු හරහා ණය යෝජනා ක්‍රමයක් 2005 අයවැය සමඟින් ක්‍රියාත්මක කරන ලදී.කිසියම් හේතුවක් මත එසේ ණය ලබාගත් නිලධාරියෙකු මියයාම හෝ පූර්ණ අකර්මණ්‍යතාවයට පත්වීම හෝ වෛද්‍ය හේතූන් මත විශ්‍රාමයාම හේතුවෙන් ගෙවීමට නොහැකිවන අවස්ථාවලදී එම හිඟ ණය මුදල් පියවීමේ අරමුණින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඉහත ඇපකර අරමුදල ස්ථාපනය කරන ලදී. ඒ අනුව භාණ්ඩාගාර බැදුම්කරවල රු. මිලියන 916 මූලික ආයෝජනයක් සහිතව යථෝක්ත අරමුදල 2005.08.05 දින ස්ථාපනය කරන ලදි.

ඒ අනුව 2005.04.26 දිනැති අංක 122 දරණ අයවැය චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මෙම අරමුදල ක්‍රියාත්මක කිරීම, එහි මුදල් ආයෝජනය කිරිම, ආයෝජන ආදායම් රැස්කිරිම සහ ඉහත සඳහන් පරිදි ගෙවීමට අපොහොසත්වූ ණය ශේෂයන් පියවීම යන කාර්යයන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

2010, 2011 හා 2012 වර්ෂය තුළදී සුදුසුකම් ලැබූ නිලධාරින් වෙනුවෙන් පියවන ලද හිඟ ණය ශේෂයන්හි සාරාංශය වගුව 8.4 (ඉ) මඟින් පෙන්නුම් කෙරේ.

වගුව 8.4 (ඉ) හිඟ ණය ශේෂ පියවීම සාරාංශය

වර්ෂය	2010	2011	2012
නිලධාරින් සංඛ්‍යාව	39	46	63
මුළු ණය මුදල (රුපියල්)	29,098,098	31,605,785	47,144,445

මෙම අරමුදල ආරම්භයේ සිට 2012.12.31 දින දක්වා රාජ්‍ය නිලධාරින් 238 දෙනෙකු වෙනුවෙන් රු. 165,564,967 ක මුදලක් ගෙවීමෙන් අනතුරුව පහත දැක්වෙන පරිදි අරමුදලේ ශේෂය රු.1,326,328,081 ක් විය.

2012 වර්ෂයේදී අරමුදලේ ක්‍රියාකාරිත්වයේ සාරාංශය පහත පරිදි වේ.

වගුව 8.4 (ඊ) දේපල ණය ඇපකර අරමුදලේ ක්‍රියාකාරිත්වය -2012

2012.01.01 දිනට ශේෂය		
භාණ්ඩාගාර බැදුම්කර	916,231,000	
පොදු තැන්පත් ගිණුම	374,991,276	**1,291,222,276**
එකතු කළා - ලැබීම්		
පොලී ආදායම		82,250,250
		1,373,472,526
අඩු කළා - ගෙවීම්		
ණය ශේෂ නිරවුල් කිරීම		(47,144,445)
2012.12.31 දිනටශේෂය		
භාණ්ඩාගාර බැදුම්කර	916,231,000	
පොදු තැන්පත් ගිණුම	410,097,081	**1,326,328,081**

මෙම අරමුදලේ මූලික ආයෝජනය වූ රුපියල් මිලියන 916 ට කිසිදු බලපෑමක් සිදු නොවන පරිද්දෙන් එහි ආයෝජන ආදායමෙන් හිඟ මුදල් පියවීමට මෙතෙක් හැකිවී ඇති බව ඉහත වගුවෙන් පෙනී යයි.

8.5 භාණ්ඩාගාර කේවල ගිණුම් පද්ධතිය හා විද්‍යුත් ගෙවීම් පද්ධතිය

භාණ්ඩාගාර කේවල ගිණුම් පද්ධතිය භාවිතය මඟින් වර්ෂයේදී පහත ඉලක්ක සපුරා ගැනීම තුලින් දකුණු ආසියාවේ මූල්‍ය කළමණාකරණයේ ඉදිරියෙන් සිටීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට හැකි විය.

1. 2012 වර්ෂයේදී අන්තර් බැංකු ගනුදෙනු හැර රුපියල් බිලියන 4,365.1 ක මුළු ලැබීම් හා රුපියල් බිලියන 4,548.8 ක මුළු ගෙවීම් මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ඇත. මෙම සියළුම ලැබීම් හා ගෙවීම් සිදු කරන ලද්දේ මුදල් ලැබීම් වවුචර් 8,816 කින් හා ගෙවීම් වවුචර් 15,926 කිනි.

   ශ්‍රී ලංකාවේ මූල්‍ය ගනුදෙනු ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව, පහසුව හා ආරක්ෂිත බව තහවුරු කරමින් මෙම සියළුම ගෙවීම් වවුචර් ගනුදෙනු 15,556 ක් මඟින් සිදු කරන ලදී.

   මෙම මුළු ගනුදෙනු වලින් 88.5%ක් එනම් 14,109 ක්ම සිදු කරන ලද්දේ විද්‍යුත් ගෙවීම් පහසුකම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව හා මහජන බැංකුව හරහාය. ඊට අමතරව තත්කාලීන දල පියවුම් ක්‍රමය හරහා අන්තර් බැංකු ගනුදෙනු 370 ක් සිදු කරන ලදී. තවද මුළු ලැබීම් වලින් 8,798 ක්ම එනම් 35% ක් සිදු කරණ ලද්දේ චෙක්පත් භාවිතා නොකර මුදල් මාරු කිරීම් හරහාය.

   ශ්‍රී ලංකා මූල්‍ය වෙළඳපොලේ ප්‍රබලතම කොටස්කරු වශයෙන්, 2012 වර්ෂයේදී විශාල වටිනාකමින් යුත් චෙක්පත් සංසරණය වීම අඩු කර ගැනීමට මෙම දෙපාර්තමේන්තුවට හැකි විය. එමඟින් ශ්‍රී ලංකාවේ මූල්‍ය ගණුදෙනුවල කාර්යක්ෂමතාවය, ආරක්ෂාව හා සඵලදායී බව ඉහළ නැංවින.

   එමෙන්ම රජයේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව 14,109 ක ගනුදෙනු පිළිබඳ තොරතුරු වියදම් ආයතන වෙත විද්‍යුත් මාධ්‍ය මඟින් යැවීමට හැකියාව ලැබුණි. මෙම විද්‍යුත් තැපැල් භාවිතය හේතු කරගෙන තැපැල් වියදම් අඩුකර ගැනීමත් තැපෑලේදී සිදුවන ප්‍රමාදයන් මඟහරවා ගැනීමටත් හැකි විය.

2. මෙම තනි ගිණුම් පද්ධති ස්ථාපනය කිරීමත් සමඟම භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම පුළුල් කර ගැනීමට හැකිවීමේ හේතුවෙන් බැංකු කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීමටත් බැංකු අයිරා හා ඒ මත දැරීමට සිදුවන පොලී වියදම අඩුකර ගැනීමටත් හැකි විය.

එමෙන්ම සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දවස අවසානයේ බැංකු ගිණුම්වල භාවිතා නොකල බැංකු ගිණුම්වල ශේෂය ඵලදායිව භාවිතා කිරීම මඟින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමේ බැංකු අයිරාව අඩු කර ගැනීමට හැකිවිය.

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බැංකු ගිණුම්වල පවතිනු ලබන භාවිතා නොකල බැර ශේෂය 2012 වර්ෂයේදී රු.බිලියන 40 කට ආසන්න අගයක් ගන්නා ලද අතර එය මෙම ගිණුම් පද්ධතිය මඟින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට ආපසු බැර කිරීම මඟින් අයිරා පොලී වියදම රු.බිලියන 4.3 ක් ඉතිරි කර ගැනීමට හැකිවිය. මෙම ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක නොවී නම් මුළු අයිරා පොලිය 36.6%කින් ඉහල යාමට ඉඩ තිබුණි.

වගුව **8.5 (අ)**